# සමාජානුයෝජන ක්‍රියාවලිය සඳහා පවුලේ ඇති බලපෑම

ඒ.ටී.එල්. අතුකෝරල

## හැඳින්වීම

මිනිසුන්ගේ චරිත ස්වභාවය, පෞරුෂය හා ඔවුනට ආවේණික විවිධ ලක්ෂණ ඇති වීම සඳහා සුවිශේෂී බලපෑම් එල්ල කරන සාධක පවති. ප්‍රවේණිය හෙවත් ආරය, පරිසරය හා සංස්කෘතික වටපිටාව ඉන් විශේෂ තැනක් ගනී. පුද්ගලයාගේ දේහමය ලක්ෂණ නිර්මාණය වීම පිණිස මවුපිය පාර්ශවයේ ජෛවීය ආවේණිය මූලික වන බව කායික විද්‍යාඥයින්ගේ මතය යි. තව ද මවුපිය පරම්පරාවෙන් හිමි ගති ලක්ෂණ, පුරුදු පුහුණු වීම් හා ඇබ්බැහිකම් ද යම් විටක හැකියා ද ස්වභාවයෙන් පුද්ගලයාට හිමි වේ. මෙමගින් පැහැදිලි වනුයේ පුද්ගල ලක්ෂණ ස්වභාවයෙන් අභ්‍යන්තරීකරණය වී ඇති බවයි. එම ස්වභාවික ලක්ෂණ නිසි ආකාරයෙන් පාලනය කර සමාජ අපේක්ෂිත මට්ටමකට රැගෙන යාම සමාජානුයෝජන ක්‍රියාවලිය මගින් සිදු කරයි. එහි දී සමාජ අපේක්ෂිත ධනාත්මක ලක්ෂණ ඇති කර සංවර්ධනය කිරීමටත් ඍණාත්මක ලක්ෂණ දුර්වල කර නිෂ්ප්‍රභා කිරීමටත් කටයුතු කෙරේ. මෙම ක්‍රියාවලිය සෑම සමාජ විද්‍යා විෂය ක්ෂේත්‍රයක ම පාහේ සාකච්ඡාවටත් පර්යේෂණ කාර්යයටත් භාජනය වී ඇති බව නූතන සමාජ විද්‍යා විෂයය පිළිබඳ අවධානය කරන අවස්ථාවල දී පැහැදිලි වේ.

උපත ලබන අවස්ථාවේ මිනිස් සත්ත්වයා ඉතා ම දුර්වල ය, ආරක්ෂාව හා අවශ්‍යතා නිසි පරිදි නොලැබුන හොත් මිය යාමට වුව ද අවකාශය ඇත. එහෙත් වසර කිහිපයක් ඇතුළත අන් සෑම සත්ත්වයෙකුට සාපේක්ෂ ව ඉතා ම ඉහළ මට්ටමේ හැකියාවන් දක්වති. ළමා අවධිය තුළ ජීවත් වීම සඳහා ත්, අපේක්ෂා කෙරෙහි ළඟා වීමට අවශ්‍ය දෑ අභ්‍යන්තරීකරණය කර ගැනීම සඳහා ස්වභාවයෙන් ම පුද්ගලයා සූදානමින් සිටී. මෙවැනි ලක්ෂණවලින් සමන්විත බිළිඳු හා ළමා අවධිය තුළ සිදු වන සමාජානුයෝජන ක්‍රියාවලිය ඉතා සුවිශේෂී එකකි. පුද්ගල චර්යාව හැඩ ගැසීම කෙරෙහි උපයුක්ත

ධර්මතා, සමාජ අපේක්ෂා, පොදු විශ්වාස හා අගය වැනි දෑ සමාජයේ නිරන්තර ව ඇති වෙමින් වෙනස් වෙමින් පවතී. එකී පොදු රටාවන් සඳහා පුද්ගලයා පුරුදු පුහුණු කිරීමත් සමාජය වෙත අනුගත කිරීමත් සමාජානුයෝජනයේ දී නිරන්තර ව සිදු වේ. මෙම ක්‍රියාවලිය සඳහා පවුල නැමැති සමාජ සංවිධානය ඉතා ම සමීප ව සම්බන්ධ වන බැවින් සමාජානුයෝජන ක්‍රියාවලිය සඳහා පවුලේ ඇති බලපෑම කෙබඳු ද යන්න අධ්‍යයනය කිරීම මගින් සාර්ථක ව සුවිශේෂී කරුණු රැසක් අනාවරණය කර ගැනීමට අවස්ථාව සලසනු ඇත. ඒ අනුව මෙම පරිච්ඡේදය මගින් සමාජානුයෝජනය සඳහා පවුලේ ඇති බලපෑම පිළිබඳ විමර්ශනය කිරීම අරමුණු වේ.

**සමාජානුයෝජන ක්‍රියාවලිය**

මිනිස් සමාජය ගතික ය. සෑම කාල නිමේෂයක ම නවකයන් සමාජගත වන අතර පරිණත වැඩිහිටියන් තම භූමිකාව රඟ දක්වමින් සිට කාලය ඇවෑමෙන් කාලක්‍රියා කරති. මෙම ක්‍රියාවලිය වේගවත් ය. නූතන සෞඛ්‍යය, තාක්ෂණික, අධ්‍යාපනික හා සමාජීය ක්ෂේත්‍රවල පවතින දියුණුව නිසා මිනිස් ජනගහනයේ වර්ධනය ඉතා ම වේගවත් වී ඇත. එම නිසා ලෝකයේ පවතින සෑම සමාජයකට ම නවකයන් නිරන්තර ව සම්බන්ධ වේ. මෙලෙස සමාජයට ඇතුළු වන සමාජ නවකයන් සමාජ ක්‍රියාවලිය සඳහා අනුගත නොවුන හොත් සමාජයේ තිර පැවැත්මට එමගින් නිෂේධනාත්මක බලපෑම් ඇති වේ. මෙම නිෂේධනාත්මක බලපෑම් අවම කිරීමේ අරමුණු සහිත ව සමාජ නවකයන් සමාජගත කිරීමේ ක්‍රියාවලිය සමාජානුයෝජන ක්‍රියාවලිය ලෙස සරල ව පැහැදිලි කළ හැකි ය. මේ පිළිබඳ විද්වත් මත එකිනෙක විශ්ලේෂණයට ගොදුරු කිරීමෙන් සමාජානුයෝජනය පිළිබඳ පැහැදිලි අර්ථ දැක්වීමකට එළඹිය හැකි ය.

සමාජානුයෝජනය පිළිබඳ විවිධ අර්ථ විග්‍රහ සුවිශාල ප්‍රමාණයක් විෂය ක්ෂේත්‍රය අධ්‍යයනය මගින් හඳුනා ගත හැකි ය. සමාජානුයෝජනය හෙවත් 'Socialization' යන ඉංග්‍රීසි පදයෙන් අර්ථ දැක්වෙනුයේ නවකයන් සමාජ ක්‍රියාවලියට අනුගත කිරීමේ කර්තව්‍යය යි. මේ අදහස තවදුරටත් තහවුරු කරන අමරසේකර (2016: 80), වීරකෝන් (2020: 186) පෙන්වා දෙන්නේ තමා ඉපදෙන භෞතික

වටපිටාව හා සංස්කෘතිය පිළිබඳ ව කිසිදු වැටහීමක් නොමැතිව උපත ලබන මිනිස් සත්ත්වයන් තම සමාජ හා සංස්කෘතිය වෙත අනුගත වනුයේ සමාජානුයෝජන ක්‍රියාවලිය මගින් බව යි.

මේ අර්ථ දැක්වීම පිළිබඳ සාර්ථක විග්‍රහයක් ඉන්ක්එල්ස් (Inkeles, 1966: 615) දක්වා ඇත. ඔහු සමාජානුයෝජනය ලෙස අර්ථ දක්වනුයේ,

"පුද්ගලයෙකු ජීවත් වන භෞතික හා සමාජ සංස්කෘතික පසුබිමට හුරු වීමට උදව් කරන පෞද්ගලික ලක්ෂණ, කුසලතා, ආකල්ප, අගයන්, අවශ්‍යතා හා ප්‍රජානන, යත්න රටා පිළිබඳ ව දැනුම ලබන ක්‍රියාවලිය" ලෙස ය.

සමාජයක වෙසෙන සෑම සමාජ ජීවියෙකුට ම සමාජයේ ජීවත් වනුයේ කෙසේ ද යන්න අත්දැකීම් සපයන ප්‍රමුඛතම ක්‍රියාවලියක් ලෙස සමාජානුයෝජනය හඳුනා ගත හැකි බව ඉහත නිර්වචනවලින් පැහැදිලි වේ.

සමාජානුයෝජනය පිළිබඳ සාර්ථක අර්ථ විග්‍රහයක යෙදෙන ජයසේන (2010: 62) පෙන්වා දෙනුයේ සමාජානුයෝජනය යනු සමාජ භූමිකා රංගනය සඳහා අවශ්‍ය ශක්‍යතාව ලබා ගැනීමේ ක්‍රියාවලියක් බවයි. එනම් සමාජයක වෙසෙන සාමාජිකයන්ගෙන් අපේක්ෂිත භූමිකා ඇති බවත්, එම භූමිකා සර්ව සම්පූර්ණ ව ඉටු කිරීම ඔහුගේ හෝ ඇයගේ වගකීමක් වන බවත් ය. මේ අයුරින් අපේක්ෂිත චර්යා ඉගෙනීම සමාජ විද්‍යාඥයන් සලකනුයේ සමාජානුයෝජනය ලෙස බව ජයසේන තවදුරටත් පෙන්වා දෙයි.

සමාජානුයෝජන ක්‍රියාවලිය පිළිබඳ අර්ථ විග්‍රහ කරන අමරසේකර (2016:80) පෙන්වා දෙනුයේ,

"පුද්ගලයෙකුගේ පෞරුෂත්වය හැඩගැසීම කෙරෙහි උපයුක්ත කර ගත හැකි චර්යාධර්ම ආයතන හා පිළිවෙළ රට ආදිය සමාජය තුළ නිරන්තරව හටගනී. සමාජය තුළින් ම නැතිවී නැවත නැවතත් උපත ලබයි. අඛණ්ඩව සිදුවන එම සමාජ ක්‍රියාකාරීත්වය හමුවේ පුද්ගලයාගේ හැඩගැස්ම ද වේගයෙන් සිදුවන අතර එහි ලා එම

පුද්ගලයා සමාජයේ උගැන්මක් ද ලබා ගනී. එම උගැන්මෙහි පොදු රටාව සමාජානුයෝජනය හෙවත් අනු සංස්කෘත්‍යායනය යන නමින් සමාජ විද්‍යාඥයන් විසින් අර්ථ දක්වා ඇත."

ඉන්ක්එල්ස් හා ජයසේනගේ අර්ථ දැක්වීම්වලට වඩා පුළුල් විග්‍රහයක යෙදෙන අමරසේකර උක්ත අයුරින් අවධාරණය කරනුයේ, නිරන්තරයෙන් පවතින සමාජ සංස්කෘතිය යාවත්කාලීන වන බවත් එම සමාජ සංස්කෘතිය වෙත පිවිසෙන සියලු සමාජිකයන්ගේ පෞරුෂත්වය හැඩ ගැසීම කෙරෙහි එකී සමාජයෙන් ලබන පරිණතිය සමාජානුයෝජනය වන බව ය.

සෑම සමාජයකට ම පාහේ ඔවුන්ගේ ප්‍රමාණය කොපමණ විශාල හෝ කුඩා එකක් වුවත් ඔවුනට ආවේණික පිළිගත් පොදු විශ්වාස, හරය, අගය හා ධර්මතා පවතී. එමෙන් ම ප්‍රවේණියෙන් මෙන් ම තමා උපයා ගත් දැනුම් සම්භාරයක් ද සංස්කෘති උරුම රැසක් ද ඔවුන් සතු ව පවතී. ඒවා තමාගේ නව පරම්පරාවට උරුම කර දීම හා පවත්වා ගෙන යාම එම සමාජයේ ප්‍රමුඛ අපේක්ෂාවක් වන්නේ ය. මෙම අපේක්ෂාව සාර්ථක ව අත්පත් කර ගැනීමට එම සමාජයේ පිළිගත් පොදු ධර්මතාවන්ට එම සමාජයට පිවිසෙන නවකයන් වෙත සාර්ථක ව සම්ප්‍රේෂණය කළ යුතු ය. මෙම සම්ප්‍රේෂණ ක්‍රියාවලිය මගින් සමාජයට පිවිසෙන නවකයා එම සමාජය විසින් අපේක්ෂිත චර්යාව කරා ළඟා නොවන්නේ නම් ඔවුන් එම සමාජයේ අපගාමීන් (deviants) ලෙස හැඳින්වේ. එම අපගාමී චර්යා නිෂේධනය කරලීම මගින් සමාජය තුළ නවකයන් හැඩ ගැස්වීමේ සමස්ත ක්‍රියාවලිය සමාජානුයෝජනය ලෙස අර්ථ දැක්විය හැකි ය.

**සමාජානුයෝජනයේ විවිධ අවස්ථා හා කාරක**

සෑම මිනිසෙකු ම ජෛවීය ස්වභාවය නිසා තම අවශ්‍යතා හා සිතැගියාවන් ඉටු කර ගැනීමට විවිධ චර්යා හා අසම්මත ක්‍රියාවල නිරත වීමට ඕනෑම විටක පෙළඹේ. එම නිසා ම ඇරිස්ටෝටල් පෙන්වා දී ඇත්තේ ආගමට හා නීතිය නොවන්නට ලොව සිටිනා මෘග ගති ලක්ෂණ වැඩියෙන් ම දක්වන සත්ත්වයා මිනිසා වන බව ය. මෙකී ලක්ෂණවලින් සමන්විත ස්වාභාවික මිනිසුන් සමාජයට අනුගත කිරීමේ ක්‍රියාවලිය සමාජානුයෝජනයේ ප්‍රමුඛත ම කාර්යයක්

බව බොහෝ සමාජ විශේෂඥයන් පැහැදිලි කර ඇත. ඒ අනුව මෙම කාර්යය සිදු කරන්නන් පිළිබඳ විශේෂිත අවධානයක් යොමු කිරීම වැදගත් ය. සමාජානුයෝජනය අවධි දෙකකින් යුක්ත බව ජයසේන විග්‍රහ කර ඇත. (2010: 71) එනම්,

1. ප්‍රාථමික සමාජානුයෝජනය
2. ද්විතීයික සමාජානුයෝජනය යි.

ඍජු ව සමාජගත වීමට හා ස්වාධීන වීමට අපොහොසත් හා දුර්වල මිනිස් සත්ත්වයා මූලික ව ම සමාජය වෙත යොමු වීමට අවශ්‍ය ශක්‍යයතා වර්ධනය කර ගනු ලබන ක්‍රියාවලිය ප්‍රාථමික සමාජානුයෝජනය ලෙසත් ඉන් පසු ව තම වාස්තවික සමාජ ජීවිතය හැඩගැස්ම කෙරෙහි සම්බන්ධ ක්‍රියාවලිය ද්විතීයක සමාජානුයෝජනය ලෙසත් අර්ථ ගැන්වේ.

පුද්ගලයෙකු සිය ප්‍රාථමික සමාජානුයෝජන කාල පරිච්ඡේදයේ දී ළඟා කර ගන්නා පෞරුෂ සංවර්ධනය හා කුසලතා ඔහුගේ ජීවිත කාලයට ම ඍජු බලපෑමක් එල්ල කරන නිසා ප්‍රාථමික සමාජානුයෝජනය පුද්ගලයෙකුට ඉතා වැදගත් කාල පරිච්ඡේදයකි (ජයසේන, 2010: 72).

සමාජානුයෝජන ක්‍රියාවලිය සඳහා සම්බන්ධ වන කාරක හෙවත් මෙකී ක්‍රියාවලිය පවත්වා ගෙන යාම සඳහා සම්බන්ධ වන්නා වූ විවිධ සමාජ ඒකක කිහිපයකි. මෙම කාරක මූලික වශයෙන් විධිමත් හා අවිධිමත් ලෙස වර්ගීකරණයට භාජනය වේ. අවිධිමත් කාරක ලෙස පවුල, ජනසන්නිවේදන මාධ්‍ය හා සමවයස් කණ්ඩායම් ඇතුළත් වන අතර විධිමත් කාරක ලෙස පාසල ආදී විධිමත් අධ්‍යාපන ඒකක නම් කළ හැකි ය.

ඉහතින් සාකච්ඡාවට භාජනය වූ කාරකවලින් පුද්ගලයෙකු විසින් අභ්‍යන්තරීකරණය කර ගන්නා වූ විශේෂිත දැනුම්, කුසලතා හා ආකල්ප සම්භාරයකි. ඒවා සමාජය තුළ යහපත් ජීවියෙකු ලෙස ජීවත් වීම සඳහා මහෝපකාරී ය. එම නිසා සමාජ නවකයෙකුට සමාජයට අනුගත වීමට මෙම කාරකයන් වෙත පැවරෙන විශේෂිත කාර්යභාරය

අතිමහත් ය. එහි දී පවුල නමැති සමාජානුයෝජන කාරකය වෙත පැවරෙන කාර්යභාරය පිළිබඳ සියුම් ව විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයෙන් මින් මතු සිදු කරනු ඇත.

**සමාජානුයෝජන කාරකයක් වශයෙන් පවුල**

පවුල් සංස්ථාවේ ආරම්භය හා විකාශය පිළිබඳ පර්යේෂණ කාර්යයේ නියතු පර්යේෂකයන්ගේ අදහස් නානාවිධ ය. අවිචාරවත් ලිංගික සබඳතා පවුලේ ආරම්භයට තුඩු දුන් බව ඇතැමුන් පෙන්වා දෙති. මෙම සබඳතා නිසා මාතෘ මූලික පවුල් ආරම්භ වූ බවත් පසු ව ක්‍රමයෙන් පවුල් සංස්ථාව පීතෘ මූලික හා ද්විමූලික වශයෙන් විකාශනය වූ බව මෙම පර්යේෂණවලින් තහවුරු කරනු ලබයි. ජයසේන (2010: 85). බෞද්ධ සාහිත්‍යය තුළ ද මේ පිළිබඳ කරුණු උකහා ගත හැකි ය. එහි සඳහන් වන්නේ අවිචාරවත් ලිංගික සම්බන්ධතා පැවැත්වූවන් හෙළා දැක, ඔවුනට ගොම හා ගල්කැට ආදියෙන් මිනිසුන් දමා ගැසූ බවයි. එම නිසා කුටුම්භ හෙවත් නිවාස තනා ගත් බවත් ඒ මගින් නිවාස නිර්මාණය කර ගත් බවත් මැනවින් අග්ගඤ්ඤ සූත්‍රය මගින් පැහැදිලි කර ඇත.

සමාජානුයෝජන කාරකයක් වශයෙන් පවුල මෙතරම් වැදගත් වන්නේ කුමන හේතුවක් මත ද? කිසිදු ශක්තියක් නොමැතිව ජනනය වන අවස්ථාවේ ම සෙස්සන්ගේ පූර්ණ රැකවරණය නොවන්නට නැවතත් මිය යාමට අතිශය ඉඩකඩ ඇති සත්ත්වයා මූලික ව ම රැක බලා ගනුයේ පවුල් සංස්ථාවේ ය. මේ කාල පරිච්ඡේදය කෙතෙක් වැදගත් එකක් ද යන්න පැහැදිලි කරන අමරසේකර (2016: 84) බිළිඳා ඉපිද මුල් මාස තුන තුළ අන්තර් ක්‍රියා අත්දැකීම් ඉගෙනීමේ නිරත වන බව පැහැදිලි කරයි. මේ පිළිබඳ ළමා ඉගෙනීම පිළිබඳ පර්යේෂකයෙකු වූ ජීන් පියාජේ විසින් ද තහවුරු කර ඇත. උපතේ සිට ළමා කාලය එළඹෙන තෙක් කායික හා මානසික සංවර්ධනය කොපමණ වැදගත් එකක් ද යන්න ඔහු පර්යේෂණවලින් අවධාරණය කර ඇත (කාරියවසම්, 2008: 24-25). තවදුරටත් මේ පිළිබඳ පැහැදිලි කරන අතුකෝරල (1996: 62) අන් කවර ක්ෂීරපායී සත්ත්වයන්ටත් වඩා අපරිණත ව ඉපදෙන මිනිස් සත්ත්වයා සෙසු සත්ත්වයන්ට වඩා ඉතා ඉහළ මට්ටමින් සංවර්ධනය වීමට රැකවරණය හා ආරක්ෂාව

අවශ්‍ය බව යි. මෙම සියල්ල සඳහා පසුබිම සකසන්නේ ද ක්‍රියාත්මක වන්නේ ද පවුල් සංස්ථාව වන බැවින් සමාජානුයෝජනයේ වැදගත් ම කාර්යයක් ඉටු කරන්නේ පවුල මගිනි. එම නිසා පවුලට හිමි කාර්යභාරය පිළිබඳ සියුම් ව අධ්‍යයනය කළ යුත්තේ ය.

**සමාජානුයෝජනයේ දී පවුලට හිමි කාර්යය**

සෑම මිනිසෙකුගේ ම ජීවිත ගමන් මගෙහි ආරම්භය හා ජීවිතය සඳහා සූදානම් වීම කුටුම්භය ආශ්‍රිත පරිසරයේ දී සිදු වේ. එකී පරිසරයේ ඇති ධනාත්මක හා ඍණාත්මක සාධක එම පවුල තුළ හැදී වැඩෙන දරුවන්ගේ පෞරුෂය කෙරෙහි මෙන් ම කායික හා මානසික සංවර්ධනය සඳහා ද ඍජු බලපෑමක් එල්ල කරයි. එපමණක් නොව ඔවුන්ගේ සමස්ත ජීවිත කාලය තුළ තමා හැදුණු වැඩුණු පවුල් පසුබිමෙහි බලපෑම පුද්ගලයෙකු තුළ අභ්‍යන්තරීකරණය වී ඇති බව පර්යේෂකයන් පෙන්වා දී ඇත අමරසේකර (2016: 86). මෙමගින් පැහැදිලි වනුයේ සමාජානුයෝජන කාරකයන් අතර පවුල නමැති ප්‍රාථමික සමාජානුයෝජන කාරකයේ කාර්යභාර්ය අතිශය වැදගත් එකක් වන බව ය.

පවුල නමැති කුඩා ම සමාජ සංවිධාන ඒකකය වර්තමානය වන විට පැහැදිලි කිරීමට අපහසු සංකල්පයක් බවට පත් වෙමින් පවති. ඊට හේතු වනුයේ අතීතයේ දී පවුල පීතෘ මූලික හෝ මාතෘ මූලික සංවිධානයක් ලෙස ස්වභාවික ව පැවැති පවුල වර්තමානයේ දී සමාජ හා මානව ධර්මතා සඳහා මුල් තැන දෙමින් විවිධ පරාස තුළ විකාශය වීමට ඉඩ ලබා දී ඇත. තනි දෙමාපිය පවුල් සම ලිංගික පවුල් ඇතුළු නොයෙකුත් ආකාරයෙන් ගොඩ නැගුණු පවුල් සංස්ථා ඔස්සේ වර්තමානයේ සමාජයේ ක්‍රියාත්මක වෙමින් පවති. කෙසේ නමුත් මෙම කුමන පවුල් ප්‍රභේදයකින් වුව ද සමාජානුයෝජන ක්‍රියාවලිය සිදු වන බව පැහැදිලි කළ යුතු ය. නමුත් එම ක්‍රියාවලියේ ගුණාත්මකභාවය හා උචිත බව පිළිබඳ යම් මතවාද ද නූතනයේ පැන නැගී ඇත.

මේ පිළිබඳ පර්යේෂකයන් හා විශේෂඥයන් විසින් සනාථ කරන සාධක ඔස්සේ පවුල සමාජානුයෝජන කාරකයක් ලෙස සිදු කරන කාර්යය කොතෙක් ද යන්න විමර්ශනයට ලක් කිරීම කාලෝචිත ය.

පවුල යනු සමාජයේ ඇති වැදගත් ම හා කුඩා ම ඒකකය යි. ජීව විද්‍යාත්මක ඓන්ද්‍රියෙකු (Biological organism) ලෙස උපත ලබන සත්ත්වයා (Social Animal) සමාජීය සත්ත්වයෙකු බවට පත් කිරීමේ ක්‍රියාවලියේ වැඩි වගකීම පවුල් සංස්ථාව විසින් දරති (වීරකෝන්, 2022: 181). රැකවරණ, ස්නේහය, ආදරය හා ආරක්ෂාව වැනි මානව ධර්මවල කායික හා මානසික සංවර්ධනයට ලක් වනු පිණිස අවශ්‍ය තෝතැන්න නිර්මාණය කරනු ලබන්නේ කවරෙකුවත් නොව සිය පවුල මගින් ය. සෑම මිනිස් සත්ත්වයෙකු ම කුතුහලයෙන් යුක්ත ය. එබැවින් මොවුන් නිතැතින් ම යමක් ඉගෙනීමට නිරන්තර ව උත්සුක වීම විශේෂිත ලක්ෂණයකි. එම නිසා ම සමාජ අවශ්‍යතාව ඉටු කිරීමට හැකි ඖචිත්‍යය ගුණයෙන් යුතු දෑ දරුවන්ට නිරන්තර ඉගැන්වීමට අවකාශය නිර්මාණය කරලීම වැදගත් ය.

නව පරම්පරාව සඳහා සංස්කෘතික ප්‍රමිතීන් පවරා දීම් සඳහා ප්‍රධාන සම්ප්‍රේෂණ මාධ්‍යය ලෙස ක්‍රියාත්මක වනුයේ පවුල නමැති සමාජ ඒකකය බව නූතන සමාජ විද්‍යාවේ පියා ලෙස සැලකෙන රෝබට් මේටන් (Robert. K. Merton) පෙන්වා දී ඇත. ඔහු තවදුරටත් පැහැදිලි කරනුයේ පවුල යනු සමාජානුයෝජනයේ පමණක් නොව අඛණ්ඩ සමාජ පැවැත්ම ද තහවුරු කරන ස්වාභාවික හා පහසුවෙන් ක්‍රියාත්මක වන සමාජ ඒකකයක් බව යි. පවුල වෙත පැවරුණු වගකීම් අතර අඛණ්ඩ සමාජ පැවැත්ම සඳහා නව පරපුර බිහි කිරීම, ඔවුන් පෝෂණය කිරීම හා සමාජය වෙත අනුගත කිරීම වැදගත් කාර්යයන් වේ. මෙම සියලු කාර්ය සමාජානුයෝජන ක්‍රියාවලිය හා බැඳී පවති. මෙම නිසා සමාජානුයෝජන ක්‍රියාවලිය තුළ පවුල් ඒකකයට පැවැරෙන වගකීම සුවිශාල ය. එම වගකීම් එකිනෙක පිළිබඳ අවධානය යොමු කිරීම මෙහි දී වැදගත් ය.

සමාජය තුළ පිළිගත් පොදු හර, විශ්වාස හා අගයන් පවති. එමෙන් ම සිදු කළ යුතු, නො කළ යුතු කාර්යය ද සිරිත් විරිත් ද චාරිත්‍ර වාරිත්‍ර ද සමාජය තුළ පවති. මෙම නිසා සමාජයේ ජීවත් වන සෑම සාමාජිකයෙකු ම මෙම පොදු හරවලට මෙන් ම සිරිත් විරිත් සඳහා ද අනුගත විය යුතු ය. එසේ නො වන සෑම සාමාජිකයෙකුට ම සමාජයෙන් බැහැර වීමටත් දෝෂ දර්ශනයට ලක් වීමටත් සිදු වේ. එම සංකල්ප පිළිබඳ ළමයා අවබෝධය ලබනුයේ සිය පවුලෙනි.

කෙටියෙන් ම සමාජ සම්මත හොඳ හා නරක යන ප්‍රභේද පිළිබඳ මූලික අවබෝධය පවුලෙන් ලබති. එය සමාජයේ යහපැවැත්ම (Social Welbeing) කෙරෙහි ඉතා වැදගත් මෙහෙයක් ඉටු කර ගනු ලැබේ. සමාජ විරෝධි ක්‍රියා හෙළා දැකීමටත් එයින් අත්මිදීමටත් ළමයාගේ මනස සූදානම් කරන්නේ පවුලේ මෙම සමාජානුයෝජන ක්‍රියාවලිය මගිනි. විශේෂයෙන් ළමයා උපත ලද සමාජයේ පවතින පුරුදු, ආකල්ප, විශ්වාස හා අගය පිළිබඳ දැනුම ලබා දෙන්නේ ඔහුගේ පවුලෙනි. පවුල පිළිබඳ අදහස් දක්වන සමාජ විද්‍යාඥයන් එය මානව ගුණධර්මවල තොටිල්ල ලෙස විග්‍රහ කර ඇත්තේ මෙනිසා විය යුතු ය.

ළමයා සාමාජිකත්වය ලබා ගන්නා මුල් ම සමාජ ඒකකය පවුල් සංවිධානය යි. මව, පියා හා සහෝදර සහෝදරියන් යන පවුල් සාමාජික සාමාජිකයන් සමගින් මුසු වන ළමයි ඔහුගේ රැකවරණය හා හැඩගැස්වීම් සමගින් සමාජ අනුගත වීමට භාජනය වේ. මෙම අනුගත වීමේ ක්‍රියාවලිය පවුලේ ස්වභාවය මත වෙනස් වේ. න්‍යෂ්ටික පවුලේ සිටින ළමයාට වඩා විස්තෘත පවුලේ සිටින ළමයින් අත්දැකීම් ලැබීමේ සම්භාවිතාව ඉතා ඉහළ මට්ටමක පවති. එයට හේතු වනුයේ විස්තෘත පවුලේ මව, පියා හා සහෝදර සහෝදරියන්ට මෙන් ම සීයා, ආච්චි, බාප්පා, පුංචි අම්මා, මාමා ආදී නොයෙකුත් ඥාතීන් විස්තෘත පවුලේ ජීවත්වන නිසා ය (ජයසේන, 2010: 87). එහි දී සෙසු අය සමග ජීවත් වීමට ළමයා පුරුදු පුහුණු වන අතර එමගින් සහයෝගීතාව, කණ්ඩායම් කුසලතා ආදිය වර්ධනය කර ගැනීමට එය මනා ව ඉවහල් වේ. තව ද සම්පත් බෙදා ගනිමින් ජීවිතය සෙසු අය සමග පවත්වා ගෙන යාමට දරුවන් හුරු වෙති.

සමාජානුයෝජනය යනු හුදෙක් සමාජය වෙත සමාජ නවකයන් අනුගත කිරීම පමණක් නො වේ. චිත්තවේගී හා බුද්ධිමය වශයෙන් ද සමාජ නවකයන් සංවර්ධනය කළ යුතු ය. විශේෂයෙන් සමාජය තුළ පැවැත්ම සඳහා අවශ්‍ය කරන බුද්ධිමය හැකියා සහ කුසලතා ළමයා සංවර්ධනය කර ගැනීමට අවශ්‍ය අඩිතාලම පවුල විසින් සපයයි.

ළමා සංවර්ධනයේ දී නිරන්තර ව සාකච්ඡාවට බඳුන් වන ප්‍රජානන කුසලතා, මනෝචාලක කුසලතා, චිත්තවේගී කුසලතා හා

භාෂා කුසලතා සංවර්ධනය සඳහා පවුල ඉතා වැදගත් කාර්යයක් ඉටු කරනු ලබයි. මනෝචාලක හැකියා වැඩිහිටියන් ස්වාභාවික හැකියා ලෙස හඳුනා ගත්ත ද ඒවා ඉතා කුඩා අවධියේ දී මැනවින් පුහුණු කළ යුතු කුසලතා වේ. කතුරකින් කැපීම, හැන්දක් අල්ලා ගැනීම හා නැගීම යන සරල හැකියා මෙහි දී උදාහරණ කොට සැලකිය හැකි ය. ප්‍රජානනය යනු දැනුම මූලික කර ගත් කුසලතා වේ. යමක් මතක තබා ගැනීමේ හා අවබෝධ කර ගැනීමේ සිට දැනුම පදනම් කර ගනිමින් ඇගයීම දක්වා සියලු කුසලතා ප්‍රජානන ක්ෂේත්‍රයට අයත් වේ. මෙම කුසලතා සංවර්ධනය සඳහා පවුල් පසුබිම ඉතා වැදගත් මෙහෙයක් ඉටු කරනු ලබයි. අවබෝධයෙන් යුතු දෙමාපියන් විසින් නිරන්තර ළමයාට ඇසීමට, දැකීමට හා ස්පර්ශයෙන් ඉගෙනීමට ඉඩ හසර ලබා දේ. එය ඉතා ඵලදායී ව ප්‍රජානන කුසලතාව සංවර්ධනයට බලපායි. භාෂා කුසලතාව සම්බන්ධයෙන් පවුල වෙත පැවැරෙන වගකීම ඉතා ම වැදගත් එකකි. ළමයාගේ වචන කෝෂය හා භාවිතය පිළිබඳ මුල් ම අත්දැකීම ලබන්නේ සිය පවුල තුළ ය. එමගින් ඔහු ලෝකය හා ඉතා ඉක්මනින් නිරවුල් සබඳතා ගොඩ නගා ගනිමින් සෙසු අය සමග අදහස් හුවමාරුවට පෙළඹේ. ස්නේහවන්ත පවුල් සාමාජිකයන් සමග වැඩි කාලයක් ගත කිරීමටත් අදහස් හුවමාරු කර ගැනීමටත් ළමයින් පෙළඹෙන බවත් මනෝවිද්‍යාඥයන් සිය පර්යේෂණවලින් පැහැදිලි කර ඇත. චිත්තවේගී හෙවත් ආකල්ප, හැඟීම් හා භාවයන් සමග කටයුතු කරන්නේ කෙසේ ද යන්නත් ළමයි ඉතා හොඳ අවබෝධයක් සිය පවුලෙන් ලබති.

චිත්තවේග සබඳතා හා දරුවා සහ මව අතර ඇති වන්නා වූ සම්බන්ධතා පිළිබඳ වැඩි දුරටත් විග්‍රහ කරන අමරසේකර (2016: 84-85) දාරක මනෝ විද්‍යාඥයන්ගේ පර්යේෂණ ඇසුරින් විශේෂිත කරුණු ගණනාවක් පිළිබඳ අවධානය යොමු කර ඇත.

"දරුවා ඉගෙන ගන්නා වැදගත් ම අත්දැකීම වන්නේ මව සමග ඇති කරගනු ලබන සාමූහික සංග්‍රහශීලී බැඳියාව යි. මෙම මූලික සබඳතාව කරණ කොට ගෙන ය, දරුවා සමාජයේ අන් අය සමග ත් ඵලදායී සබඳතා අන්තර් ක්‍රියාත්මක ශිල්පීය රටා මගින් ඉගෙන ගන්නේ.

1. කිරි බීම,

2. සිනහ වීම,

3. ඇසෙන දේ ගැන අවධානය යොමු කිරීම,

4. දකින දෑ විමසිල්ලෙන් බැලීම,

5. ඔබ මොබ දණ ගෑම,

යන මූලික අවශ්‍යතා සහ පවුල තුළ මුල් අදියරේ ලැබෙන සමාජානුයෝජනයේ දී දරුවාට යම් යම් ඉගෙනුම් ලබා ගැනීමට ආධාරකාරී වන අත්දැකීම් ලෙස දාරක මනෝ විද්‍යාඥයන් පැහැදිලි කර ඇත.

මින් අදහස් වනුයේ මුළුමනින් ම පාහේ ළදරුවන් සිය පවුල් පරිසරය සමග ඒකාත්මික ව සිය දැනුම, ආවේදන හා කුසලතා සංවර්ධනය කර ගන්නා බව ය. පවුල මගින් දරුවෙකු ලබන ඉගෙනුම හා ශික්ෂණය පිළිබඳ සාරාංශගත කරන අමරසේකර (2016: 87) පහත කරුණු අවධාරණය කරයි.

1. දාරක ශරිර වතාවත් විධිමත් ව හුරු කිරීම

2. පරිසරය තේරුම් ගැනිමෙහි ලා ඉවහල් වන සමාජ ආකල්ප ඇති කිරීම

3. ජන සන්නිවේදන මාධ්‍ය සමග සම්බන්ධතා පැවැත්වීම හුරු කිරීම

4. වැඩිහිටි දාරක පරතරයෙහි විෂමතා අකාමකා දමා ඒ වෙනුවට ආරක්ෂාව පිළිබඳ හැඟීම දරුවා තුළ ඇති කිරීම

සමාජානුයෝජනය සම්බන්ධයෙන් පවුල් ඒකකය වෙත පැවැරෙන උක්ත සඳහන් වගකීම් ඇසුරින් පැහැදිලි වනුයේ සමාජ ගත වන නවකයන්, සමාජය තුළ පැවැත්ම සඳහා අවශ්‍ය පූර්ව අත්දැකීම් ලබා ගන්නේ සිය පවුල් පරිසරයෙන් බව ය.

නිසි අධ්‍යාපනයක් ලබා දීමට අවශ්‍ය කායික හා මානසික සූදානම ඇති කිරීමත්, අධ්‍යාපනය සඳහා යොමු කිරීම පවුලට පැවැරෙන වගකීම් අතර ප්‍රමුඛ පෙළේ එකකි. ළමා සංවර්ධනය පිළිබඳ අදහස් දක්වන විශේෂඥයන් පෙන්වා දෙනුයේ උපතේ සිට වසර පහත් හතත් කාලය වන විට ළමයින්ගේ කායිකමය සංවර්ධන ක්‍රියාවලිය ඉතා වේගයෙන් සිදු වන බව යි. මෙම කාලය තුළ ඉතා කඩිනමින් හා කුතුහලයෙන් යුතු ව යමක් ඉගෙනීමටත් ඒ පිළිබඳ අවධානය යොමු කිරීමටත් දරුවෝ පෙළඹෙති. මෙම වයස් සීමාවේ සිටින දරුවන් කාලය ගත කරන්නේ සිය පවුල සමග ය. එම කාලය තුළ නිවැරැදි මග පෙන්වීම යටතේ දරුවන් අධ්‍යාපන ක්‍රියාවලිය සඳහා යොමු කළ යුතු ය.

එමෙන් ම උපතේ සිට වයස අවුරුදු 16 වන තෙක් සිදු වන සීඝ්‍ර කායික සංවර්ධනය ක්‍රියාවලිය සඳහා අවශ්‍ය පෝෂණය කිරීම ද පවුලේ වගකීමකි. කායික හා මානසික වශයෙන් නීරෝගී භාවය ඇති කර ගැනීමටත් මනා පෞරුෂයකට අවශ්‍ය දේහ ලක්ෂණ ඇති කර ගැනීමටත් නිසි පෝෂණය මහෝපකාරී ය. එම නිසා කායික වශයෙන් නීරෝගී ව වර්ධනය වීම පිණිස අවශ්‍ය පෝෂණය ලබා දීම පවුලේ වගකීම් දරන පුද්ගලයන්ගේ වගකීම වන්නේ ය.

සමාජානුයෝජන ක්‍රියාවලියේ දී ඉතා වැදගත් කර්තව්‍යයක් ලෙස අධ්‍යාත්මික ව සංවර්ධනය ද පවුල විසින් ඇති කළ යුතු ය. විශේෂයෙන් දරා ගැනීමේ ශක්තිය, ඉවසීම හා තෘප්තිය ආදී චිත්තවේගිය වශයෙන් ශක්තිමත් පුද්ගලයන් සමාජය වෙත අනුගත කිරීමේ කාර්යය සඳහා පවුල විසින් විශාල සේවාවක් ඉටු කළ යුතු ය. එමගින් සමාජයේ යහ පැවැත්ම සඳහා අතිශය වැදගත් සේවාවක් ඉටු වේ.

**නිගමනය**

සමූහයක් ලෙස වාසය කිරීමට මිනිස් සත්ත්වයෝ ස්වභාවයෙන් ම රුචිකමක් දක්වති. පොදු අරමුණු සමූහයක් තෘප්ත කර ගැනීම පිණිස මිනිසා සමූහයක් ලෙස එක් ව කටයුතු කිරීම සමාජයක ඇති වෙසෙස් ලක්ෂණයක් ලෙස හැඳින්විය හැකි ය. සමාජයක සතු සිතුම් පැතුම්, චාරිත්‍ර වාරිත්‍ර, ආකල්ප, අපේක්ෂණ, පිළිගැනීම්, විශ්වාසයන්,

අගයන් හා අපේක්ෂණ සඳහා සමාජ නවකයන් පුහුණු කිරීමත් අනුගත කිරීමත් සමාජානුයෝජන ක්‍රියාවලියේදී සිදු වේ. ප්‍රාථමික හා ද්විතියික සමාජානුයෝජනය ලෙස සමාජානුයෝජනයේ මූලික අවධි දෙකකි. එම අවධිවල විධිමත් හා අවිධිමත් ලෙස එකී ක්‍රියාවලිය හා සම්බන්ධ වන සමාජානුයෝජන කාරක කිහිපයකි. එම කාරක අතර පවුල නැමැති සමාජ ඒකකය සඳහා විශේෂ ස්ථානයක් හිමි වේ. පවුල සමාජානුයෝජන ක්‍රියාවලියේ දී ඉටු කරන සුවිශේෂි කාර්යභාරය සෑම පුද්ගයෙකුගේ ම ජීවිතය තුළ සාර්ථක චර්යා අභ්‍යන්තරිකරණය කිරීමට ඉතා වැදගත් සාධකයක් වනු ඇත.

සමාජයක පවතින සියලු අපේක්ෂා සඵල වන අන්දමින් හා අපේක්ෂිත භූමිකාවන් සඳහා බිළිඳු හා ළමා අවධිය සූදානම් කිරීම දෙමාපියන්ගේ වගකීමකි. එම කටයුත්ත ක්‍රියාත්මක කිරීම සඳහා කාලය හා අවකාශය තුළ විවිධ ආකාරයෙන් පවුල ක්‍රියාත්මක වී ඇති ස්වරූපයන් විවිධාකාර ය. ඒ සඳහා පවතින සංස්කෘතික හා පාරිසරික වටපිටාව මෙන් ම පවුලේ ස්වභාවය ද බලපෑම් කර ඇති බව පැහැදිලි ය. සමාජයට සිය දරුවන් එක් කිරීමේ දී භාෂණ කුසලතා, සුදුසු චර්යාව, අධ්‍යාපනය සඳහා යෝග්‍යය පරිසරය සකස් කිරීම, සුදුසු සමාජ භූමිකා පිළිබඳ අවබෝධය ලබා දීම ආදී නොයෙකුත් කාර්ය ඉටු කිරීමට පවුල නොමඳ ව සහසම්බන්ධ වේ. එමගින් පැහැදිලි වනුයේ සෑම පුද්ගලයෙකුගේ ම චර්යාව, පෞරුෂය, භාෂණය මෙන් ම ඔහුගේ සමස්ත භූමිකාව ම නිර්මාණය කරලීම සඳහා පවුල සමාජානුයෝජන කාරකයක් ලෙස සම්බන්ධ වන බවයි. එය තහවුරු කරනුයේ බිඳුණු පවුල් හා අපගාමී චර්යා පෙන්නුම් කරන දෙමාපියන් සහිත පවුල්වල දරුවන් නිසි පරිදි සමාජානුයෝජන ක්‍රියාවලියට දායක නොවීම නිසා එම බහුතර දරුවන්ගේ පෞරුෂ, ආකල්ප හා චර්යා දුර්වලතා පැවතීම මගිනි. එම නිසා සෑම පවුලක ම දැකිය හැකි සමාජානුයෝජනය ක්‍රියාවලිය, පවුලෙන් පවුලට වෙනස් ස්වරූපයකින් ක්‍රියාත්මක වේ. එම නිසා විවිධ අපේක්ෂා හා චර්යා දක්වන ශිෂ්‍ය ශිෂ්‍යයාවන් නිරන්තර ව සමාජගත වීම සිදු වනු ඇත. මෙම ස්වභාවය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කිරීම ඉතා වැදගත් ය. අවසානයේ පෙන්වා දිය හැක්කේ සමාජානුයෝජන ක්‍රියාවලිය තුළ පවුල නැමැති සමාජ ඒකකය සක්‍රීය හා කේන්ද්‍රිය භූමිකාවක් ඉටු කරන බව ය.

## පරිශීලන ග්‍රන්ථ නාමාවලිය


අලවත්තගේ, ශ්‍රී. ප්‍රේමදාස. (2007). *පැරණි සිංහල විවාහ සංස්කෘතිය.* වැල්ලම්පිටියඃ චතුර මුද්‍රණ ශිල්පියෝ, පිටු. 265-296.

අමරසේකර, දයා. (2016). *සමාජවිද්‍යාව සිද්ධාන්ත හා විධික්‍රම.* හයවන මුද්‍රණය. කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, පිටු. 59-155.

කාරියවසම්, තිලෝකසුන්දරී. (2008). *පියාජේගේ සංවර්ධන මනෝවිද්‍යාව.* පස්වන මුද්‍රණය. බොරැල්ලඃ විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, පිටු. 31-51.

කුමාරසිරි, ජයන්ත. (2002). *සන්නිවේදනය හා පවුල.* ගාල්ලඃ ප්‍රින්ට් හවුස්, පිටු. 48-74.

කුමාර, එච්. එන්. වි. ජී. ඒ. (2001). *පවුල හා විවාහය.* මුල්ලේරියාවඃ විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, පිටු. 58-69.

ජයසේන, අසෝකා. (2010). *අධ්‍යාපන සමාජ විද්‍යාව.* කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, පිටු. 59-155.

මායාදුන්න, මිලින්ද. (2018). *සමාජ විද්‍යාවේ මූලිකාංග.* කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, පිටු. 187-261.

ලියනේගම, චන්ද්‍රසිරි. (2006). *හෙල සිරිතයි විවාහයයි.* ගම්පහ, දීපන මුද්‍රණ, පිටු. 07-52.

වීරකෝන්, උ. (2020). *අධ්‍යාපනය පිළිබඳ සමාජ විද්‍යාව,* මහනුවරඃ නෙත්වින් ප්‍රින්ටස් පුද්ගලික සමාගම, පිටු. 180-188.

Baferani, M.H. (2015) *The Role of the Family in the Socialization of Children.* Mediterranean Journal of Social Sciences, pp. 73-110. Available at: https://www.researchgate.net/publication/290977267_The_Role_of_the_Family_in_the_Socialization_of_Children/link/569d537108ae16fdf0797007/download

Good, William J. (1977) *Principles of Sociology*: McGraw-Hill, pp. 67-107

Goldthorpe, J.E. (1985) *An Introduction To Sociology.* 3rd Edition. Cambridge: Great Britain at the university press, pp. 73-110

Hughes, Michael D., Carolyn J. Koehler. (2005) *Sociology*: the core. New York: McGraw-Hill, pp. 160-201

Howard, E.F., Moris, S. (2010) *Role of the Family in the Socialization proces,* Journal of Social phsychology. pp. 97-101. Avelable at: https://www.tandfonline.com/doi/abs/10.1080/00224545.1953.9921873